# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2398/40 - 2024 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2024.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(2) ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් පහත උපලේඛනයේ සඳහන් විෂයයන් හා කාර්යයන් සහ ආයතන 2024 අගෝස්තු මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ව්‍යාපෘති සංවර්ධන අමාත්‍ය ගරු අලි සාහිර් මෞලානා සෙයියඩ් මැතිතුමා වෙත පැවරීම නිශ්චය කරනු ලැබ ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2024 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

1A - G 42578 — 355 (2024/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

*අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ව්‍යාපෘති සංවර්ධන අමාත්‍ය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තුවල විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br><br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br><br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br><br>4. සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ඉටුකර ගැනීමෙහිලා එකී ව්‍යාපෘති සහ වැඩසටහන් අධීක්ෂණය කිරීම, මෙහෙයවීම හා ඇගයීම<br><br>5. මහා භාණ්ඩාගාරය මගින් කරනු ලබන කාර්යයන් වඩා කාර්යක්ෂම හා ඵලදායීව ඉටුකරලීම පිණිස එකී කාර්යයන් ඩිජිටල්කරණය කිරීමට අදාළ පරිවර්තනයන් කිරීම සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය<br><br>6. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br><br>7. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | 1. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව<br><br>2. තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | |

EOG 08 - 0308

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.